# කොළඹ විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදී තෙවන වසර උපාධි පරීක්ෂණය

## පළමු සෙමෙස්තරය - 2021/2022

## BST 3148 – බෞද්ධ කලාව හා ගෘහනිර්මාණ ශිල්පය I

(පැ දෙකයි)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

1. බෞද්ධ කලා නිර්මාණවල භාවිත සංකේත වනාහි අර්ථ සම්පන්න දාර්ශනික නියෝජන බව සාධක සහිතව පෙන්වා දෙන්න.

2. ස්තූපයෙහි ඓතිහාසික පසුබිම විස්තර කොට, ස්තූප නිර්මාණයෙහිදී භාවිත කළ බහුවිධ ද්‍රව්‍ය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයට යොමු වෙමින් සාකච්ඡා කරන්න.

3. මධ්‍යකාලීන ලංකාවේ බුද්ධප්‍රතිමාවල විශේෂ ලක්ෂණ පෙන්වාදෙමින් ඒවා කෙරෙහි බලපෑ විදේශීය නිර්මාණ ආභාසය පරීක්ෂා කරන්න.

4. ''විසිවන සියවසේ ලක්දිව බෞද්ධ විහාර සිතුවම්, ඇස පිනවන කලාවක් ලෙස වර්ධනය වී ඇත'' යන විචාරක මතයට අවම වශයෙන් විහාර තුනක සිතුවම් කෙරෙහිවත් යොමුවෙමින් කරුණු දක්වන්න.

5. ආරාම නිර්මාණකරණය පිළිබඳ චුල්ලවග්ගපාළියේ සේනාසනක්ඛන්ධකාගත තොරතුරු සමාලෝචනය කොට, ලක්දිව පධානඝර විහාරාරාමවල ගෘහ නිර්මාණ ශිල්පය විස්තර කරන්න.

6. මාතෘකා දෙකකට (02) කෙටි සටහන් සපයන්න.

   I. කලාව පිළිබඳ බුදුසමයේ අදහස
   II. ආරෝග්‍යශාලා විහාරාරාම
   III. අජන්තා ලෙන් විහාර සිතුවම්
   IV. බුද්ධප්‍රතිමාවේ මහාපුරුෂ ලක්ෂණ

******************